අධ්‍යාපන අමාත්‍යාංශය

# පාසල් ශිෂ්‍ය නායක මණ්ඩල තෝරාගැනීම පිළිබඳ උපදෙස් සංග්‍රහය

විෂය සමගාමී, මාර්ගෝපදේශ හා උපදේශන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය"
බත්තරමුල්ල.

# පෙරවදන

රටේ අනාගතය තීරණය කරන ප්‍රමුඛතම බලවේගය ළමා පරපුරයි. ශ්‍රී ලාංකේය අභිමානය සුරක්ෂිත කරමින් රට ජාත්‍යන්තර තලය දක්වා ඔසවා තැබීමේ අනාගත භාරකරුවා වන්නේ ද අපගේ ළමා පරපුරයි. රටට අවැසි නිවැරදි නායකත්වයක් ගොඩනැඟීමේ භාරදූර කාර්යය පාසලට පැවරී තිබේ. එම කාර්යය ඉටු කිරීම සඳහා පාසලේ ශිෂ්‍ය නායක / නායිකා මණ්ඩලයට පැවරෙන්නේ සුවිශේෂී වගකීමකි.

පාසලක ශිෂ්‍ය නායක / නායිකා මණ්ඩලය තේරීම ස්වාධීන හා විනිවිද භාවයකින් යුතු වීම මූලික සාධකයක් වෙයි. විවිධ සාමාජීය සාධකවලින් බැහැරව සමානාත්මතා මූලධර්ම මත පිහිටා ශිෂ්‍ය නායක නායිකාවන් තෝරාගත යුතුය. ශිෂ්‍යනායකයින් තේරීමේ ක්‍රියාවලිය සර්ව සාධාරණ විය යුතු මෙන්ම ප්‍රමිතියෙන් හා විනිවිදභාවයෙන් ද යුක්ත විය යුතුය. එය ඉටු කරගැනීම සඳහා පාසල් ශිෂ්‍ය නායක නායිකාවන් තෝරා ගැනීම පිළිබඳව සකසා ඇති මෙම උපදෙස් සංග්‍රහය බෙහෙවින් ඉවහල් වනු ඇත. ප්‍රමිතිගත තෝරාගැනීමේ පිළිවෙතක් උදෙසා මෙම උපදෙස් සංග්‍රහය අවස්ථානුරූපීව හා අනුයෝගීකරණයෙන් යුතුව යොදාගත හැකිය.

පාසල්වල ප්‍රාථමික හා ජ්‍යෙෂ්ඨ යන අංශ ද්විත්වය සඳහාම ශිෂ්‍යනායක මණ්ඩල තෝරා පත්කර ගැනීම පිළිබඳ මාර්ගෝපදේශයක් මෙමඟින් ඉදිරිපත් කරන බැවින් එය පාසල් පද්ධතිය තුළ නායකත්ව කුසලතා සංවර්ධන ක්‍රියාවලියේ මෙතෙක් පැවති අඩුවක් සපුරාලනු ඇත.

අභිප්‍රේරණය වූ අභිමානවත් ශිෂ්‍ය නායක මණ්ඩලයක් තුළින් පාසල් පද්ධතියේ සාධනීය වෙනසක් සිදුකිරීම සඳහා මෙම උපදෙස් සංග්‍රහය ඉවහල් වන බව අපගේ විශ්වාසයයි.

# හැඳින්වීම

ශිෂ්‍යනායක නායිකා තනතුර පාසල් ශිෂ්‍යයන්ට ලබා දෙන භාරදූර වගකීමකි. නායකත්ව කුසලතා වර්ධනය කරගැනීම සඳහා ලබාදෙන මහඟු අවස්ථාවකි. එය සමාජයට අවශ්‍ය නායකයන් බිහි කිරීමේ මූලික පියවරයි. එසේම ශිෂ්‍යනායකයෙකු ගේ කාර්යභාරය පාසලේ <u>පරිපාලනය, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඇතුළු පාසලේ සමස්ත ක්‍රියාවලියටම තීරණාත්මකව බලපායි.</u>

පාසල් පද්ධතිය තුළ ශිෂ්‍යනායක නායිකාවන් පත්කිරීමේ ක්‍රියාවලියේදී එක් එක් පාසල, එම පාසලට අනන්‍ය වූ විවිධ ක්‍රමවේද භාවිත කරන බව නිරීක්ෂණය වේ. මේ හේතුවෙන් ඇතැම් විට ශිෂ්‍ය ශිෂ්‍යාවන්හට සාධාරණ අවස්ථා අහිමි වන බව ද දක්නට ඇත. පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළ පවත්නා නායකත්ව ගුණාංග ඉස්මතු කරලීමටත්, එම ගුණාංග වඩාත් ඔප් නංවා ගැනීමටත් ලැබෙන අවස්ථා වඩාත් විනිවිදභාවයෙන් යුක්තව පාසල තුළින් සම්පාදනය කරගැනීමටත්, ශිෂ්‍යනායක නායිකාවන් තෝරාගැනීමේ ක්‍රියාවලියේ දී පවතින ගැටළුකාරී තත්වයන් අවම කරගැනීමටත්, නිසි මාර්ගෝපදේශයක් ලබාදීම අත්‍යාවශ්‍ය බව අධ්‍යාපන අමාත්‍යාංශය හඳුනාගෙන ඇත.

මෙම උපදෙස්සංග්‍රහය මඟින් පාසල් පද්ධතිය තුළ ශිෂ්‍යනායක නායිකාවන් පත්කර ගැනීමේදී එක් එක් පාසලට අනන්‍ය වූ ක්‍රමවේද වඩාත් සාධාරණව පාසලට අනුගත කරගැනීමට ඉඩ ප්‍රස්ථා සලසා දී ඇත.

ඒ අනුව උපදෙස්සංග්‍රහය හඳුන්වා දීමේ මූලික අරමුණු පහත පරිදි වේ.

- ශිෂ්‍යනායකත්වය සඳහා සාධාරණ අවස්ථා සම්පාදනය කිරීමේදී විදුහල්පතිවරුන්ට <u>මාර්ගෝපදේශයක්</u> ලබාදීම.
- ශිෂ්‍යනායක / නායිකාවන් තෝරාගැනීම පිළිබඳ පාසල් තුළ පොදු හා සාධාරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.
- පාසල තුළ නායකත්ව අවස්ථා පුළුල් කිරීම.
- ශිෂ්‍ය පෞරුෂය සංවර්ධනය කරගැනීමට ශක්තිමත් මූලික පදනමක් ගොඩනැඟීම සඳහා අවස්ථා ලබාදීම.
- පාසලේ කළමනාකරණ හා පරිපාලන කාර්යයන් සඳහා ශිෂ්‍ය සහභාගීත්වය වැඩිදියුණු කිරීම.

මෙම උපදෙස් සංග්‍රහය සැකසීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල කිහිපයකි.

- **තමා හා පරිසරය පිළිබඳ ආදරයෙන් හා සතුටින් සිටින පුරවැසියන් බිහි කිරීම.**
- **සුපිළිපන්න සමාජයක් උදෙසා විනයගරුක ශිෂ්‍යභාවය ශක්තිමත් කිරීම.**
- **අවස්ථානුකූල නායකත්වය ඉස්මතු කිරීම.**
- **ශිෂ්‍යයන්ගේ බහුවිධ කුසලතා, මෘදු කුසලතා හා ධාරිතා සංවර්ධනය.**
- **අභියෝගයන්ට සාර්ථකව මුහුණ දිය හැකි මනා ආත්ම විශ්වාසයෙන් හෙබි සිසු පිරිසක් බිහි කිරීම.**
- **පාසල් පරිපාලන හා කළමනාකරණ ක්‍රියාවලිය වඩා ශක්තිමත් හා කාර්යක්ෂම කිරීම.**
- **මනා පෞරුෂයකින් යුතු අනාගත පුරවැසියන් බිහි කිරීම.**

ඉහත අරමුණු සාක්ෂාත් කරගනිමින් සාර්ථක ශිෂ්‍යනායකයෙකු / නායිකාවක බිහි කරගැනීම සඳහා මෙම උපදෙස් සංග්‍රහය ඵලදායී මෙහෙවරක් ඉටුකරනු ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශයේ විශ්වාසයයි.

## පටුන


01 පරිච්ඡේදය- නායකයා හා ශිෂ්‍යනායකත්වය

02 පරිච්ඡේදය - ප්‍රාථමික අධ්‍යාපන අංශයේ සිසුන් සඳහා නායකත්ව අවස්ථා සම්පාදනය

2.1. ප්‍රාථමික අධ්‍යාපන අවධිය තුළ අවස්ථානුකූල නායකත්වය
2.2. ප්‍රාථමික අධ්‍යාපන අංශයේ ශිෂ්‍යනායක මණ්ඩලය
2.2.1. ප්‍රාථමික අධ්‍යාපන අංශය සඳහා ශිෂ්‍යනායකයින් තෝරාගැනීමේ ක්‍රමවේදය
2.3. ශිෂ්‍ය නායක මණ්ඩලයේ සංයුතිය,ප්‍රධාන තනතුරු හා කාර්යය පැවරීම
2.4. ප්‍රාථමික අංශයේ ශිෂ්‍යනායක සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සංයුතිය
2.5. අභියාචනා මණ්ඩලය
2.6. ශිෂ්‍යනායක මණ්ඩලය මෙහෙයවීම හා නියාමනය
2.7. ශිෂ්‍යනායකත්වයෙන් ඉල්ලා අස්වීම හා ශිෂ්‍යනායකත්වය අහෝසි කිරීම

03 පරිච්ඡේදය - ද්විතියික අධ්‍යාපන අංශයේ සිසුන් සඳහා නායකත්ව අවස්ථා සම්පාදනය

3.1 නායකත්ව අවස්ථා සම්පාදනය පිළිබඳ පොදු ව්‍යුහය
3.2. ආධුනික ශිෂ්‍යනායක සංචිතය
3.2.1. ආධුනික ශිෂ්‍යනායක සංචිතය සඳහා බඳවා ගැනීමේ ක්‍රමවේදය
3.2.2.ආධුනික ශිෂ්‍යනායක සංචිතය සඳහා කාර්යය හා වගකීම් පැවරීම
3.2.3.ආධුනික ශිෂ්‍යනායක සංචිතය අභිප්‍රේරණය හා ඇගයීම
3.3. ශිෂ්‍ය නායක මණ්ඩලය
3.3.1. ශිෂ්‍යනායක මණ්ඩලය සඳහා අයදුම් කිරීම හා බඳවා ගැනීමේ ක්‍රමවේදය
3.3.2. ලකුණු ලබා දීමේ ක්‍රමවේදය - කනිෂ්ඨ ශිෂ්‍යනායක මණ්ඩලය/ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යනායක මණ්ඩලය
3.4. ශිෂ්‍යනායක / නායිකාවන්ගේ පරිවාස කාලය
3.5 ප්‍රධාන ශිෂ්‍යනායක මණ්ඩලය
. 3.5.1 සංයුතිය
3.5.2 පත් කිරීම
3.6 ශිෂ්‍යනායකත්වයෙන් ඉල්ලා අස්වීම හා ශිෂ්‍ය නායකත්වය අහෝසි කිරීම

04 පරිච්ඡේදය - ශිෂ්‍යනායක / නායිකාවන් ගේ වගකීම් හා කාර්යභාරය

4.1. ශිෂ්‍යනායක / නායිකාවන්ගේ වගකීම් ක්ෂේත්‍රය
4.2. ශිෂ්‍යනායක / නායිකාවන්ගේ වගකීම් හා කාර්යභාරය
4.3. අනෙකුත් යෝජනා

05 පරිච්ඡේදය - ශිෂ්‍යනායක ධාරිතා සංවර්ධන වැඩසටහන්

06 පරිශිෂ්ටය - ඇමුණුම් I සිට V දක්වා